# අඹගහහේන ග්‍රාමයේ පාරම්පරික ව පවත්වාගෙන එනු ලබන අම්පිටිය ශාන්තිකර්මය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

සඳරුවන්.එම්.අයි.ටී,[1] රණවීර.ආර්.ඒ.කේ.එස්,[2] සේනාතිලක.එන්.එච්.ඩී.එම්.ඕ.කේ.[3]

වසර 300කට අධික ඉතිහාසයකට උරුමකම් කියන ප්‍රාදේශීය සංස්කෘතිකාංගයක් ලෙස අම්පිටිය ශාන්තිකර්මය හඳුනාගත හැකි ය. මෙය අදටත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඹගහහේන ගම්මානයේ දැකගත හැකි චාරිත්‍රයකි. මෙම සාම්ප්‍රදායික චාරිත්‍රය තුළින් ප්‍රාදේශීය ජනයාට කායික හා මානසික සුවතාවයක් ලැබේ ද යන්න හඳුනාගැනීම පර්යේෂණ ගැටලුව වේ. ඒ අනුව අම්පිටිය මඟින් සිදුකරනු ලබන චාරිත්‍රයන් හඳුනාගැනීම, ඒවා සිදු කිරීමෙන් ජනයා අපේක්ෂා කරන්නේ මොනවාද හා එමඟින් පුද්ගල ආකල්පවල ස්වාභාවය කෙසේ වෙනස්වේ ද යන්න අධ්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ. මෙහි පර්යේෂණ ක්‍රමවේදය වූයේ ක්ෂේත්‍ර අධ්‍යයනය යි. අතීතයේ සිට කලට වැසි ලැබී සෙත් ශාන්තියක් උදා කරලීම උදෙසා ගම්මාන 12ක සහභාගිත්වයෙන් මසක කාලයක් පුරාවට සිදු කරන චාරිත්‍රයන් සමුදායක් එක් වූ ශාන්තිකර්මයක් ලෙස අම්පිටිය සැලකේ. අන්‍යෝන්‍යය සහයෝගිතාවයෙන් ආරම්භ කරන මෙහි පළමු චාරිත්‍රය කප් සිටුවීම යි. මෙහි දී පිරිසිදු කරගත් භූමියක් තෝරාගෙන කහ දියර ඉස මුරුංගා කෝටුවක් එහි සිටුවීම කපු මහතාගේ කාර්යයකි. අනතුරුව අං ඇදීමේ චාරිත්‍රය පළමු සති දෙක තුළ සිදුකරන අතර වියැකී යන ජන ක්‍රීඩාවක් ලෙස කායික විනෝදාස්වාදය මුල් කරගනිමින් පවත්ව යි. තවද පාරම්පරික ආගමික ක්‍රීඩාවක් වශයෙන් පොර පොල් ගැසීම මේ හා සමගාමී ව ගැමියන් විසින් සිදු කරයි. එමෙන් ම අම්පිටිය ශාන්තිකර්මයේ වැදගත් ම චාරිත්‍රය වනුයේ තිස්පා තුනක තොයිලය සිදු කිරීම යි. මෙය ත්‍රිවිධ රත්නය පෙරටු කරගෙන පත්තිනි දෙවියන්ට හා රජ්ජුරු බණ්ඩාර දෙවියන්ට භාරහාර වීමෙන් පත්තිනි හැල්ල මුල්කොට සිදු කරයි. මෙම චාරිත්‍රයන් සිදු කිරීමෙන් ගමට යහපතක් සිදුවන බව ගැමි විශ්වාසය යි. එමඟින් දෙවියන්ගෙන් ගමට ආශිර්වාදය ලැබී වස් දොස් දුරු වී කලට වැසි ලැබෙන ලෙස ප්‍රාර්ථනා කිරීම ජන සිරිත යි. එසේ ම මීට ජන ක්‍රීඩාවන් සම්බන්ධ වී තිබීම තුළ කුඩා දරුවාගේ සිට වැඩිහිටියා දක්වා ශරීර සුවතාවයත්, කායික සමබරතාවයත් ගෙන දෙන බව පැහැදිලි වේ. එමෙන් ම ගැමියන් අතර සමඟිය සහයෝගය තහවුරු වීමටත් කෘෂි භෝගවලින් යහපත් අස්වැන්නක් ලැබීමටත් හේතු වේ. ඒ සඳහා පත්තිනි දෙවියන්ගේ ආරක්ෂාව හා ආශිර්වාදය ලැබීම පුද්ගල මනස පීඩනයෙන් නිදහස් කිරීමට උපකාරී වේ. ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක වන අම්පිටිය ශාන්තිකර්මයෙහි චාරිත්‍රයන් නිවැරදි වත්පිළිවෙත් සිදු කිරීමෙන් අවසන් කරයි. එමෙන් ම මෙම සංස්කෘතික මංගල්‍යය පුද්ගල මානසික ආතතිය මගහැරවීමටත් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් උදාකරලීමටත් ගැමියාට උපකාර වන බව මනාව පැහැදිලි වේ. අතීත ජනශ්‍රැතික දැනුම මතු පරපුරට දායාද කරන මෙවැනි පැරණි ශාන්තිකර්මයන් රැකගනිමින් ඉදිරි අනාගතයට ජීවමාන කිරීම අප කාගෙත් යුතුකම වන්නේ ය.

**ප්‍රමුඛ පද :** අම්පිටිය, ශාන්තිකර්මය, විශ්වාසය, චාරිත්‍රය, මානසික

[1,2,3] සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ishanthilina1996@gmail.com